# මේ අමාරු කාලේ ජීවත්වෙන තාලේ

- සාරිය වෙනුවට පහසු ඇඳුමක්
- ඔෆිස් නොයා ගෙදර ඉඳන් වැඩ
- පවුලේ සමගියට මුල් තැන



**හැම කැලෑවකම ඉන්න හැම සිංහයෙක්ම ඉර පායන හැම පාන්දරකම හිතන දෙයක් තියනවා..**

**"මේ කැලේ අඩුම වේගයෙන් දුවන මුවාට වඩා මම වේගවත් නොවුනොත්, මට මැරෙන්න වෙනවා......" කියන එක.**

**ඒ වගේම තමයි හැම කැලෑවකම සිටින හැම මුවෙක්ම ඉර පායන හැම දවසකම හිතන දෙයක් තියනවා.**

**"මේ කැලේ වේගයෙන්ම දුවන සිංහයාට වඩා මම වේගවත් නොවුනොත් මට මැරෙන්න වෙනවා...." කියන එක.**

ඉතින් ජීවිතේ කියන්නේ දිවිල්ලක් තමා. ඒ දිවිල්ලේ කවුරුත් හෝ පරදිනවා. තවත් කෙනෙක් දිනනවා. ඒ කොහොම වුනත් නැවතිල්ලක් නෑ. තමන්ගේ දරුවෝ නිසා, දමවුපියන් නිසා, පවුලේ ආදරණීයයන් නිසා අපට දුවන්නම වෙනවා. සැනසිල්ලේ ගිමන් හරින්න තරම ජයග්‍රාහී මාවතකට සිහිනෙකින්වත් අපි තවමත් පැමිණ නැති නිසා රටක් විදියට හති හල හලා වුනත් දුවන්නම වෙනවා. ඒත් මෙ දිවිල්ලෙන් දැන් ජනතාව වෙහෙසට පත්වෙලා. අපට මෙ වෙහෙස තවත් වැඩිපුර දැනෙන්නේ මෙ මොහොතේ අපි රටක් විදියට අති විශාල සමාජ බිඳවැටීමකට පත්ව ඇති නිසා. මෙ බිඳවැටීම සිදුවී ඇත්තේ, දේශපාලනික, ආගමික, සංස්කෘතික තීරණ සියල්ලේම දුර්වලතාව නිසා වෙන්න පුළුවනි. මෙ නිසා කාන්තා පුරුෂ දෙපාර්ශවයම දැඩි අපහසුතාවකට පත්වෙලා. නිවසේ ප්‍රධාන භූමිකාව හිමිවන ගෘහිනියන්ට එය මානසිකව වගේම තවත් පීඩාකාරී ගැටලුවක් බවට පත්වෙලා.

පවුලක අම්මා, බිරිඳ කියන්නේ තාත්තා කෙනෙක්ට නොදෙවෙනි වගකීම් රැසක් පැවරිලා තියන කෙනෙක්. ඇයට දරුවන්ගේ වගකීම සමග, ගෙදර උයන පියන කටයුතු සහ රැකියාවක් කරන කාන්තාවක් නම් ඒ වගකීමත් පැවරෙනවා. එහෙත් දැන් රටේ පවතින ආර්ථික අර්බුදය නිසා මිනිස්සුන්ගේ වටිනා කාලය මහමඟ පෝලිම්වලට ගෙවෙනවා. ගෙදර පියා ඉන්ධන පෝලිමෙ නම් මව සිටින්නේ ගෑස් පෝලිමෙ. මෙ කටයුතු නිසා කලට වෙලාවට රැකියාවට යන්න ක්‍රමයක් නැහැ. වෙලාවට රැකියාවට නොයන නිසා රැකියාවෙ ගැටලු. ඒ නිසා ආර්ථික අපහසුතා තව තවත් වැඩිවෙනවා.

## අමාරු කාලේ තවත් අමාරු කරගන්නේ අපිමද?

මෙ මොහොතේ පවතින අපහසු තත්ත්වයට ගැළපෙන විදියට අප වෙනස්විය යුතුමයි. මොනතරම් අපහසුතා තිබුණත් සංස්කෘතිය පිට දමමින් සමහර අවස්ථාවල්දී අප කටයුතු කරන්නේ අපටම අවාසිදායක ලෙසයි. විශේෂයෙන් ඇඳුම් පැළඳුම්වල්දී ඒ තත්ත්වය වැඩිපුරම දකින්න පුළුවනි.

> යල් පැනගිය අදහස් සහ තීරණවල එල්ලී සිටිනවාට වඩා තැනට ගැළපෙන තීරණ ගැනීමට කටයුතු කළ යුතුමයි. එසේ නොවුනොත් තව තවත් අසීරුවට ලක්වෙන්නේ අපිමයි.

පවතින ඉන්ධන හිඟය සමග පුද්ගලික වාහනවල රැකියාවට එන පිරිස් බහුතරයක් දැන් එන්නේ පොදු ප්‍රවාහන සේවයෙන්. ඒ විතරක් නොවෙයි වෙනදාට බස් එකෙන් ගිහින් නිවසට යන්නට තිබෙන ඉතිරි කෙටිදුර වුනත් ත්‍රිවිල් රථයෙන් ගිය වැඩි දෙනෙක් දැන් යන්නේ පයින්. හුඟක් වෙලාවට පොදු ප්‍රවාහනයේදීත් තදබදය නිසා හිටගෙන යෑමට සිදුවෙනවා. මේ අපහසුතා සියල්ල විඳගෙන රැකියාවට එන්නේ අපහසුවෙන්. මෙහෙම අපහසු වෙලාවක සාරිය වගේ ඇඳුමක් ඇඳගෙන සිටීම තවත් අපහසුවක්. මෙ දිනවල උදෑසනට කෑම බීම පිසගැනීමට අපහසු නිසා කාලය සීමිතයි. එහෙම වෙලාවට මෙ වගේ ඇඳුමක් අඳින්න තවත් කාලයක් ගතවෙනවා. ඒ විතරක් නොවෙයි වෙනදට ත්‍රීවිල්වලින් ගමන් ගිය පිරිස් දැන් පයින් යන නිසා සාරිය වගේ ඇඳුමකින් ඉක්මනින් පහසුවෙන් ගමන් කිරීමද අපහසුවේ. ඒ නිසා පාසල් ගුරුවරුන්ට සහ අනෙකුත් රාජ්‍ය සේවකයින්ට සාරිය වෙනුවට ආයතනයට ගැළපෙන වෙනත් පහසු ඇඳුමක් ඇඳගෙන ඒමෙ පහසුව තිබේ නම් වඩාත් සුදුසුයි.

පවතින වටපිටාව සමග තාවකාලිකව හෝ එවැනි තීරණ ගැනීම ඉතා වටිනවා. කෑම බීම, අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම අපට නතර කිරීමට නොහැකි වුනත්, පහසුවෙන් ගැනීමට හැකි තීරණ ක්‍රියාත්මක කරන්න පුළුවනි. එසේ නම් අපි මෙ පවතින කාලයට ගැළපෙන විදියට සූදානම් විය යුතුයි. සමාජයක් ලෙස අදහස්වලින්, බුද්ධියෙන් අපි දියුණු විය යුතුයි. ඇඳුම් නිසා අපරාධ සිදුවෙනවා යැයි අපි සිතනවා නම් අප සිටින්නේ තවමත් ප්‍රාථමික අදහස්වලයි. එසේ සිතනවා නම් සාරිය කියන්නේ ද සම්පූර්ණයෙන් සිරුර වැසෙන ඇඳුමක් නොවෙයි. ඊට වඩා සංවර වූත් අවස්ථාවට ගැළපෙන පහසු ඇඳුම් ඔනෑ තරම් තිබෙනවා.

එහෙත් තවමත් සාරිය ඇඳිය යුතුමයි කියලා සිතන පිරිසකුත් අප අතර නැතුවම නොවෙයි. ඒ නිසා රටක පවතින අසීරු අවස්ථාවක ඒ අවස්ථාවට ගැළපෙන තීරණ ගන්න, ඒවා ක්‍රියාත්මක කරන්න බැරිව හණමිටි අදහස්වල සිටිනවා නම් අපට රටක් විදියට දියුණුවෙන්න නොහැකිවීම පුදුමයකුත් නොවෙයි.

## අවස්ථාවට ගැළපෙන තීරණ ගනිමු

කාර්යාලවලදී වුනත් ක්‍රියාත්මක වන නීතිරීති මෙ අවස්ථාවේ තිබෙන අපහසුතාවට තරමක් හෝ පහසුවක් වෙනවා නම් එය රැකියා කරන සියලුදෙනාට අස්වැසිල්ලක්. මොනදේ වුනත් වෙලාවට වැඩට එන්න ඔනෑ කියන කාරණය මෙ මොහොතේ සාධාරණ නැහැ. බොහෝ තැන්වල නියමිත වේලාවට පැමිණීමට අපහසු අය සිටින නිසා ඔවුන් වෙනුවෙන් යම් සහනයක් ලබාදීමට කටයුතු කිරීම හෝ මේ මොහොතේ නිවසේ සිට සේවය ලබාගත හැකි සියලුදෙනා නිවසේ රඳවා සේවය ලබාගන්නට කටයුතු කිරීම ආයතන ප්‍රධානියන්ගේ වගකීමක්.



අදහස් දැක්වීම
**ආචාර්ය**
**අනූෂා එදිරිසිංහ,**
**අධ්‍යක්ෂක,**
**ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයන කේන්ද්‍රය. කැලණිය විශ්වවිද්‍යාලය.**

ඒ වගේම සේවකයන්ගේ පැත්තෙන්ද අවංකවීම වැදගත්. ඇතැම් ආයතනවල සේවකයින් මෙ පවතින අපහසුතාව ප්‍රයෝජනයට ගනිමින් තමන්ට රැකියාවට පැමිණීටම හැකියාව තිබුණත් එසේ නොකරන අවස්ථා තිබෙනවා. එයින් ඇත්තටම අපහසුතාවට පත්වන පිරිස තවත් අපහසුතාවට පත්වෙනවා. ඒ නිසා අපි මේ මොහොතේ අවංකව වැඩ කිරීම වැදගත්. එයින් සෑම කෙනකුගේම අයිතිවාසිකම් රැකෙනවා විතරක් නොවෙයි, මානසික පීඩනය යම් තරමක් හෝ අවම වෙනවා.

නිවසේදී වුනත් මවුපියන්ගේ වගකීම වෙනදාටත් වඩා වැඩි වී තිබෙන නිසා, දරුවන් සහ පවුලේ අනෙක් උදවියගේ සහයෝගය එකිනෙකාට වෙනදටත් වඩා අවශ්‍ය වෙනවා. මේ ගමන සහයෝගයෙන් දිවිය යුතුමයි. යල් පැනගිය අදහස් සහ තීරණවල එල්ලී සිටිනවාට වඩා තැනට ගැළපෙන තීරණ ගැනීමට කටයුතු කළ යුතුමයි. එසේ නොවුනොත් තව තවත් අසීරුවට ලක්වෙන්නේ අපිමයි.

■ සටහන: **නයනා උදයංගනී**